# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2111/8 - 2019 පෙබරවාරි මස 18 වැනි සඳුදා - 2019.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

DIK/LAN/02/63

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබාගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ/පරවශතාවේ විස්තර*:

මාතර දිස්ත්‍රික්කයේ, දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, දික්වැල්ල උතුර ග්‍රාම නිලධාරී වසමේ වලස්ගල ගමේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි. මාර 2770 දරන මූලික පිඹුරේ පෙන්වා ඇති පහත සඳහන් බිම් කොටස.

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: බුලත්දළුගහවත්ත සහ පන්විලහේන; විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: නාකුළුගමුව, හඳපාන්ගොඩැල්ල, මහගෙදර පදිංචි නන්දාවතී වීරසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0155.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: බුලත්දළුගහවත්ත සහ පන්විලහේන; විස්තරය: ගෙවත්ත, මිශ්‍ර බෝග වගාවක් ඇත; හිමිකම් කියන අය: නාකුළුගමුව, හඳපාන්ගොඩැල්ල, මහගෙදර පදිංචි නන්දාවතී වීරසිංහ; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5070.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2019.03.21 වැනි දින පෙ.ව. 10.30 ට දික්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද 2019.03.13 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම්/පරවශ්‍යතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

බී. එස්. රන්ජිත,
ප්‍රාදේශීය ලේකම්,
දික්වැල්ල.

2019ක් වූ පෙබරවාරි මස 13 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දික්වැල්ල.

03 - 264




මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## නිවැරදි කිරීමයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමේ සංශෝධනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රය* අංක 1882/45 හා 2014 ඔක්තෝබර් 03 වන සිකුරාදා ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම.

ඉහත දැන්වීමේ හි අනු අංක 33 යටතේ සඳහන් කැබලි අංක 821 එහි සඳහන් ප්‍රමාණය හෙක්ටයාර් 0.0039 යන ප්‍රමාණය හෙක්ටයාර් 0.0019 යනුවෙන්ද සංශෝධනය වන බව මෙයින් දැනුම් දෙමි.

ඩී. පී. සී. උදය කුමාර,
ප්‍රාදේශීය ලේකම් (වැ.බ),
මහව.

03 - 265